

# යුක්තිය උදෙසා ඉදිරියට පිය නගමු

2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත

**සුසැරි සෙවන**

දූෂණයට එරෙහි නීති උපදේශන සේවය

TRANSPARENCY INTERNATIONAL SRI LANKA

a nation that upholds integrity

## යුක්තිය උදෙසා නැගී සිටීම නිසා ඔබට අනතුරක් සිදුවේ යැයි ඔබ බිය වන්නේද?

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ ඔබට සහය සහ ආරක්ෂාව ඉල්ලා සිටිය හැක.


01

## වින්දිතයකු හෝ සාක්ෂිකරුවකු ලෙස ඔබට මුහුණ දීමට සිදුවෙන අභියෝගයන් මොනවද?

- තර්ජන ගර්ජන, හිරිහැර කිරීම්, බියවැද්දීම්, පළිගැනීම් වලට ඔබ හෝ ඔබේ පවුල ලක්වීම
- නිසි වෛද්‍ය ප්‍රතිකාර සහ සාත්තුව නොලැබීම
- සමාජ අපකීර්තියට ලක්වීම සහ මානසික පිහිටාධාර නොලැබීම
- ඔබට හෝ ඔබගේ පවුලට සිදුවූ පාඩුවට හෝ කරදරයට මූල්‍ය සහන නොමැතිකම

## අපට මෙවැනි නීතියක් ලැබුනේ ඇයි ?

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත නීතියක් වීමට පෙර ශ්‍රී ලංකාව තුළ ඔවුන් ආරක්ෂා කිරීම උදෙසා ක්‍රමවත් නෛතික රාමුවක් නොතිබුණි. සාර්ථක ලෙස යුක්තිය පසඳ ලීම සඳහා අත්‍යවශ්‍ය වන, අයිතීන් සහ හිමිකම් කිහිපයක් මෙම නීතිය මඟින් වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ලබා දී ඇත.



03

නව නීතියට අනුව ,

# ඔබ වින්දිතයෙක්ද ?

## ඔව්, ඔබ

● යම් වරදක් හෝ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමක් හෝ රඳවා ගැනීමක් නිසා කායික, මානසික, චිත්තවේගී, ආර්ථික හෝ වෙනත් අලාභයක් ලබා ඇත්නම්

● යම් වරදක් සිදුවීම වැලැක්වීමට මැදිහත් වී හෝ වින්දිතයෙකුට සහය වීමේ ප්‍රතිඵලයක් ලෙස හානියක් විඳ ඇත්නම්

## ඔබ වින්දිතයෙකු වේ.

## නොඑසේනම්, ඔබ ඉහත කී අර්ථකථනයට අදාළ වන,

● ළමයෙකුගේ මව, පියා හෝ භාරකරු නම්

● පුද්ගලයකුගේ පවුලේ සාමාජිකයෙකු, ළඟම ඥාතියෙකු හෝ යැපෙන්නෙකු නම්

● පුද්ගලයකුට සුවිශේෂී වටිනාකමක් ඇති කෙනෙක් නම්

## ඔබ වින්දිතයෙකු වේ.



05

# ඔබ සාක්ෂිකරුවෙක්ද ?

## ඔව්, ඔබ

- වරදක් පිළිබඳ හෝ මූලික අයිතිවාසිකමක් කඩවීමක් හෝ මානව හිමිකමක් උල්ලංඝනය වීමක් ගැන පැමිණිල්ලක් කර ඇත්නම්
- වරදක්, මූලික අයිතිවාසිකමක් කඩවීමක් හෝ මානව හිමිකමක් උල්ලංඝනය වීමක් පිළිබඳ විමර්ශනයකදී තොරතුරු හෝ ප්‍රකාශයක් කර ඇත්නම්
- වින්දිතයකුගේ පැමිණිල්ලකට හෝ නඩුවකට සහය වීමක් ලෙස දිවුරුම් ප්‍රකාශයක් හෝ ප්‍රකාශයක් දී ඇත්නම්
- කොමිසම් සභාවකට තොරතුරු හෝ නිවේදනයක් සපයා ඇත්නම්
- උසාවියක් හෝ කොමිසම් සභාවක් ඉදිරියට කැඳවනු ලැබූ හෝ ඉදිරියේදී කැඳවනු ලැබේ යැයි විශ්වාස කෙරේනම්

## ඔබ සාක්ෂිකරුවෙකු වේ.
## නොඑසේනම්, ඔබ ඉහත කී අර්ථකථනයට අදාළ වන,

- ළමයෙකු නම්
- ළමයෙකුගේ මව, පියා හෝ භාරකරු නම්
- පුද්ගලයකුගේ පවුලේ සාමාජිකයෙකු හෝ යැපෙන්නෙකු නම්
- පුද්ගලයකුට සුවිශේෂී වටිනාකමක් ඇති කෙනෙක් නම්

## ඔබ සාක්ෂිකරුවෙකු වේ. එසේත් නැත්නම්, ඔබ

- යම් වරදක්, මූලික අයිතිවාසිකමක් කඩවීමක් හෝ මානව හිමිකමක් උල්ලංඝනය වීමක් ගැන විමර්ශනය කර ඇති රජයේ නිලධරයකු නම්
- අපරාධයක වින්දිතයකු නම්
- විශේෂඥ සාක්ෂිකරුවෙකු නම්
- වෘත්තියේ සාක්ෂිකරුවකු නම් ද **ඔබ සාක්ෂිකරුවෙකු වේ.**



07

# ඔබ අකටයුතු නාදකරන්නෙක්ද ?

ඔව්, ඔබ සේවා ස්ථානයේ සිදුවූ වරදක්, මූලික අයිතිවාසිකමක් කඩවීමක් හෝ මානව හිමිකමක් උල්ලංඝනය වීමක් ගැන පැමිණිල්ලක්, තොරතුරක් හෝ කටඋත්තරයක් දීම නිසා

- යම් හිරිහැරයකට, බියගැන්වීමකට, බලකිරීමකට හෝ බිඳ වැටීමකට ලක්වී ඇත්නම්
- රැකියාවේ අහිතකර වෙනසකට ලක්වී ඇත්නම්

**ඔබ අකටයුතු නාදකරන්නෙකු වේ.**

# වින්දිතයකු ලෙස ඔබට (වගන්තිය 3)

● සමානව, සාධාරණව සහ ගරුත්වයට සහ පෞද්ගලිකත්වයට ගෞරව වන සේ සලකවා ගනු ලැබීමට
● ඉක්මන්, සුදුසු සහ සාධාරණ සහනයන් ලබා ගැනීමට
● තර්ජන ගර්ජන, බියගැන්වීම් පළිගැනීම් වැනි හානී වලින් ආරක්ෂා වීමට
● මානසික සහ කායික ආබාධ සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට
● නෛතික ප්‍රතිකර්ම, කරගෙන යනු ලබන විමර්ශන වල තත්වය සහ ලබාගත හැකි සහනයන් පිළිබඳව දැනුවත් වීමට
● වරදක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට සහ එයට අදාළ විමර්ශනය සිදුකරවා ගැනීමට
● විමර්ශන, පරීක්ෂණ සහ අධිකරණ වලදී අවශ්‍ය නෛතික නියෝජනයන් ලබා ගැනීමට
● රජයේ රස පරීක්ෂකවරයාගේ වාර්තා වැනි වාර්තා වල සහතික පිටපත් ලබාගැනීමට
● අධිකරණ හෝ අර්ධ අධිකරණ වල කාර්යයන්ට සහභාගී වීමට අවශ්‍ය සහය සහ තොරතුරු ලබාගැනීමට

**අයිතියක් ඇත.**

## ඔබට පහත දැක්වෙන හිමිකම්ද ඇත (වගන්තිය 4).

● සිදුවූ වරදක් නිසා හෝ අධිකරණයක හෝ අර්ධ අධිකරණයක කටයුත්තකට සහභාගී වීමට දරන වියදම පියවා ගැනීමට මුදලක් ලබා ගැනීමට
● රජයට සම්පත් ඇති විටෙකදී අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර රජයෙන් ඉල්ලීමට සහ ලබා ගැනීමට
● අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට වැයවෙන මුදල් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියෙන් (අධිකාරිය) ඉල්ලා සිටීමට



## සාක්ෂිකරුවෙකු ලෙස ඔබට (වගන්තිය 5)

- සාධාරණව සහ ගරුත්වයට සහ පෞද්ගලිකත්වයට ගෞරව වන සේ සලකවා ගනු ලැබීමේ
- හානි, තර්ජන, බියගැන්වීම් හෝ පලිගැනීම් වලින් ආරක්ෂා වීමේ

**හිමිකම් ඇත.**



11

# ඔබට ලැබිය හැකි සහන හා ආරක්ෂාවන් මොනවාද*? (වගන්තිය 22)

- ඔබට සහ ඔබගේ දේපලවලට ආරක්ෂාව
- තාවකාලික නවාතැන්
- ස්ථිර ස්ථානගත කිරීම්
- තාවකාලික හෝ ස්ථිර රැකියා
- නව හැඳිනුමක් ලබාදීම
- අවශ්‍ය යැයි සලකන වෙනත් පියවර

## ආරක්ෂාව සැලසිය හැකි කාල පරිච්ඡේදය

- අපරාධ විමර්ශනයක් පවත්වන කාලය තුළදී හෝ ඉන්පසුව
- කොමිෂන් සභා විසින් විමර්ශනයක් පැවැත්වීමට පෙර, පවත්වන කාලය තුළ හෝ පැවැත්වීමෙන් පසු
- නඩුවක කටයුතු පැවැත්වීමට පෙර, පවත්වන කාලය තුළ හෝ පැවැත්වීමෙන් පසු

* මෙම ආරක්ෂාවන් පවතින සම්පත් වලට අනුව ලබාදේ.



# ඔබට ආරක්ෂාවන් පිළිබඳ ඉල්ලීම් යොමු කළ හැක්කේ කා වෙතද?

## (වගන්තිය 21)

- අධිකාරියට

- පොලිස් දෙපාර්තමේන්තුවේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාශයට

- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට, මානව හිමිකම් කොමිෂන් සභාවට, පරීක්ෂණ කොමිෂන් සභාවකට හෝ ජනාධිපති විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාවට

- යම් පොලීසියක ස්ථානාධිපතිවරයාට

# ඔබට වන්දි ඉල්ලුම් කිරීමට හිමිකමක් ඇත්ද? (වගන්තිය 30)

## ඔබ වින්දිතයෙකු නම් ඔබට,

● සිදුවූ කායික හෝ මානසික හිංසා, හෝ දේපලවලට සිදුවූ පාඩු වලට වන්දි හා

● අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර, පුනුරුත්ථාපන හෝ උපදේශන සේවා ලබා ගැනීමට අවශ්‍ය මුදල් ඉල්ලුම් කළ හැක.

## එමෙන්ම

වන්දියක් ලෙස වින්දිතයෙකු හෝ සාක්ෂිකරුවෙකු වෙත රුපියල් මිලියනයකට නොවැඩි මුදලක් ගෙවීමට මහාධිකරණයක් හෝ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කරන පුද්ගලයකුට නියම කිරීමට එම අධිකරණ වලට බලය ඇත.

## යුක්තිය ලබාගැනීමට කටයුතු කිරීමේදී හෝ නීතියට උදවු කිරීමට යාමේදී එයට යම් කෙනෙක් බාධා කර ඇත්ද?



## උදාහරණ ලෙස

- ඔබට හෝ ඔබට සුවිශේෂී වටිනාකමක් ඇති පුද්ගලයෙකුට හානියක් සිදුකිරීමට තර්ජනය කිරීම (කීර්තිනාමයට හෝ දේපල වලට හානි කිරීමට තර්ජනය කිරීමද ඇතුලුව)

- ඔබට හෝ ඔබගේ දේපල වලට හානි සිදුකිරීම

- යම් ස්ථානයකින් පිටව යන ලෙසට ඔබට බල කිරීම

- ඔබගේ තොරතුරු බෙදාහැර හෝ ප්‍රසිද්ධියට පත් කර ඔබගේ ජීවිතය අනතුරකට ලක්කිරීම

- ඔබව නිහඬ කිරීමට අල්ලසක් ලබා දීම

එසේ බලපෑම් කරන තැනැත්තන් බන්ධනාගාරගත කිරීම හා ඔවුන්ගෙන් දඩ මුදල් අය කර ගැනීම වැනි දැඬුවම් වලට යටත් කල හැක (වගන්තිය 8)



# තොරතුරු හා උදව් ලබාගත හැකි අධිකාරියේ හා කොට්ඨාශයේ තොරතුරු

**පොලිස් දෙපාර්තමේන්තුවේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාශය**

දුරකථන අංකය - 011 2 326 314

ලිපිනය - නො. 9 මිහිඳු මාවත, කොළඹ 12

**අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරිය**

දුරකථන අංකය - 011 2 866 452

ලිපිනය - පළමු මහල, 428/11 ඒ ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල

**සුසැරි සෙවන**

දූෂණයට එරෙහි නීති උපදේශන සේවය

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා**

දුරකථන අංකය - 011 2 501 503

ලිපිනය - 5/1, එලිබෑන්ක් පාර, කොළඹ 05

ඊ මේල්: help@tisrilanka.org  වෙබ් අඩවිය: www.tisrilanka.org